දිවයින 2020 පෙබරවාරි මස 01 වැනිදා සෙනසුරාදා

# මේ වර්ෂයේදී ආර්ථික ක්‍රියාකාරකම්වල වැඩි දියුණුවක් අපේක්ෂා කරනවා

## මහ බැංකුව කියයි

ශ්‍යාම් නුවන් ගනේවත්ත

මේ වර්ෂයේ (2020) ආර්ථික ක්‍රියාකාරකම්වල වැඩිදියුණුවීමක් අපේක්ෂා කරන බව ශ්‍රී ලංකා මහබැංකුව කියයි.

ශ්‍රී ලංකා මහ බැංකුවේ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව නිකුත් කළ නවතම වාර්තාවක මේ බව සඳහන්ය.

එහි මෙසේද සඳහන් වේ.

නැගී එන වෙළෙඳපොළ ආර්ථිකයන්, විශේෂයෙන් ඉන්දියාව තුළ අපේක්ෂිත මට්ටමට වඩා මන්දගාමී ආර්ථික වර්ධනයක් පැවතීම හේතුවෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ලෝක ආර්ථික දැක්මෙහි (World Economic Outlook) 2020 ජනවාරි ප්‍රකාශය මගින් ගෝලීය වර්ධන පුරෝකථනයන් පහළ දමමින් සංශෝධනය කර ඇත. ගෝලීය ආර්ථිකය 2019 වසරේදී සියයට 2.9 කින් වර්ධනය වී ඇතැයි ඇස්තමේන්තු කර ඇති අතර, 2020 සහ 2021 යන වසරවලදී පිළිවෙළින් සියයට 3.3 කින් සහ සියයට 3.4 කින් වර්ධනය වනු ඇතැයි පුරෝකථනය කර ඇත. මේ අතර චීනයේ ආරම්භ වූ කොරෝනා වෛරසය පැතිරීම හේතුවෙන් ගෝලීය වර්ධනය පුරෝකථන සඳහා තවදුරටත් බලපෑම් එල්ල වී ඇත. මන්දගාමී ගෝලීය ආර්ථික වර්ධනය සහ අඩු උද්ධමන පීඩනය සැලකිල්ලට ගනිමින් 2020 වසරේ මේ දක්වා කාලය තුළදී දියුණු ආර්ථිකවල මහ බැංකු විසින් ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයක් අඛණ්ඩව පවත්වාගෙන යන ලද අතර, 2020 වසරේ මේ දක්වා කාලය තුළ නැගී එන වෙළෙඳපොළ ආර්ථිකවල මහ බැංකු ගණනාවක් ප්‍රතිපත්ති පොලී අනුපාතික තවදුරටත් අඩු කළේය.

දැනට පවතින දර්ශක සහ නවතම




ඇස්තමේන්තු අනුව කෘෂිකාර්මික සහ කර්මාන්ත ආශ්‍රිත ක්‍රියාකාරකම්වල මන්දගාමී වර්ධනය මූලිකවම හේතු වෙමින් 2019 වසරේ හතරවැනි කාර්තුව තුළදී දේශීය ආර්ථික කටයුතු මන්දගාමීව පැවතිණි. කෙසේ වෙතත්, සුදුසු රාජ්‍ය මූල්‍ය හා මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග, ව්‍යාපාර විශ්වාසය වැඩිදියුණුවීම සහ දේශපාලන ස්ථාවරභාවයෙහි සහාය ඇතිව 2020 වසරේදී ආර්ථික ක්‍රියාකාරකම්වල වැඩිදියුණු වීමක් අපේක්ෂා කෙරේ. අඩු හා ස්ථාවර උද්ධමන වාතාවරණය, තරගකාරී විනිමය අනුපාතිකය, අඩු ණය අනුපාතික මෙන්ම, වැඩිදියුණු වූ පාරිභෝගික හා ආයෝජන ආකල්ප මගින් ප්‍රතිලාභ ලබමින් මැදකාලීනව ආර්ථිකය සිය උපරිම මට්ටම කරා ළඟා වෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. රජයේ ප්‍රතිපත්තිමය ප්‍රමුඛතාවන්ට අනුකූලව සැලසුම් කෙරෙන සුදුසු ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම හරහා ආර්ථිකයේ වර්ධන ප්‍රවණතාව තිරසාරව පවත්වා ගනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ශ්‍රීලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය, 2020 ජනවාරි 29 වැනි දින පැවති රැස්වීමේදී ශ්‍රී ලංකා මහ බැංකුවේ නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පිළිවෙළින් සියයට 6.50 සහ සියයට 7.50 දක්වා පදනම් අංක 50 කින් අඩු කිරීමට තීරණය කළේය. දැනට පවතින සහ අපේක්ෂිත දේශීය ආර්ථිකයේ, මූල්‍ය වෙළෙඳපොළෙහි මෙන්ම ගෝලීය ආර්ථිකයේ ප්‍රවණතාවන් මනාව සැලකිල්ලට ගනිමින් මුදල් මණ්ඩලය මෙම තීරණය ගනු ලැබීය. මැදි කාලීනව අපේක්ෂිත සියයට 4 - 6 පරාසය තුළ මනාව පාලනය වී ඇති උද්ධමන අපේක්ෂා සහිත වාතාවරණයක් තුළ, මෙම මුදල් ප්‍රතිපත්ති තීරණය මගින් වෙළෙඳපොළ ණය අනුපාතිකවල අඛණ්ඩ පහළයෑමට උපකාරී වන අතර, එමගින් ආර්ථිකයේ අපේක්ෂිත යථා තත්ත්වයට පත්වීම සඳහා සහාය වනු ඇත.